**ශීර්ෂය - 323 - නීති කටයුතු දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 323 - නීති කටයුතු දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නීති කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 10 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 අගෝස්තු 02 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට නීති කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති රීති, රෙගුලාසි වලට යොමුව | වටිනාකම (රු.) | අනුකූල නොවීම | | |
| (අ) | මුදල් රෙගුලාසි 103(1), 104, 109(1) 109(2) | 216,155 | 2021 වර්ෂයේදි අස්ථානගතවූ ලැප්ටොප් පරිගණකය සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු අවසන් කර සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට 2024 සැප්තැම්බර් 02 වන විටත් කටයුතු කර නොතිබූ අතර වසර 03 කට ආසන්න කාලයක් ගතවී ඇතත් එය තවදුරටත් හානි පාඩු ලේඛනය තුල දක්වා තිබුණි. | මු.රෙ 104(1) (අ) අනුව පරීක්ෂණය සහ වගකිව යුත්තන් නිශ්චය කිරීමට පත්කරන ලද කමිටුවේ නිර්දේශ අනුව පොලිස් විමර්ශනයට අනුකූලව ඉදිරි කටයුතු සිදු කළ යුතු ය. පොලිස් විමර්ශනය මගින් නිශ්චිත කරුණු අනාවරණය කර ගැනීමෙන් අනතුරුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතයි. | මුදල් රෙගුලාසි පරිදි කටයුතු සිදු කළ යුතු වීම. |
| (ආ) | මුදල් රෙගුලාසි 891(i) | | ඇප ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | ඒ සම්බන්ධව ඉදිරියේදී ක්‍රියාකිරීමට කටයුතු කරමි. | එම |
| (ඇ) | මුදල් රෙගුලාසි 315 | | 2023 වර්ෂයේදී අදාල තනතුරුවල සේවය කරන ලද ඇප තැබීමට නියමිත නිලධාරීන් ඇප තැබීමක් කර නොතිබුණි. | ඒ සම්බන්ධව ඉදිරියේදී ක්‍රියාකිරීමට කටයුතු කරමි. | එම |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම් ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂයේදී පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කර කටයුතු සිදු කරමින් පවතින පනත් කෙටුම්පත් 24 ක් අතුරින් 2021 සහ 2022 වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් තුළ අන්තර්ගත කර තිබූ පහත දැක්වෙන පනත් 09 ක් 2024 | පනතක් සම්මත කිරීම ප්‍රතිපත්තිමය තීරණ මත සිදු කරනු ලබන ඉතා සංකීර්ණ ක්‍රියාවලියක් වන අතර පනත් කෙටුම්පත් සම්මත කිරීමට පාර්ලිමේන්තුව වෙත යොමු කිරීමට | සැලසුම් කළ පරිදි වාර්ෂික ක්‍රියාකාරකම් ඉටු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| අගෝස්තු 01 දින වන විටත් පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට නොහැකි වී තිබුණි.<br>• 1951 අංක 38 දරන ලෝහෝර් ආයීා ණය අරමුදල් පනත<br>• කොළඹ කොටස් හුවමාරුව අසාමුහිකරණ කිරීමේ පනත<br>• 2009 අංක 23 දරන ශ්‍රී ලංකා සහතිකලත් කළමණාකරණ ගණකාධිකාරී ආයතන පනත<br>• 2006 අංක 05 දරන මුදල් විශුද්ධිකරණ වැලැක්වීමේ පනතට සංශෝධන<br>• 2006 අංක 06 දරන මුදල් ගණුදෙනු වාර්තා කිරීමේ පනතට සංශෝධන<br>• 2005 අංක 25 දරන ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනතට සංශෝධන<br>• 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතට සංශෝධන<br>• 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) සංශෝධන පනත්කෙටුම්පත<br>• 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත පනත සංශෝධන | ප්‍රථම අදාළ විෂයයන් සම්බන්ධ ආයතන සමඟ නිරන්තරයෙන් සාකච්ඡා පවත්වන අතර එකී ආයතයන් හි වන තීරණයන් අනුව ඒවා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමේදි ප්‍රමාදයන් සිදු වීම අප දෙපාර්තමේන්තුවෙහි වගකීමක් නොවන බව පෙන්වා දෙමි.<br><br>2021 සහ 2022 වර්ෂවල රටෙහි පැවති ආර්ථිකමය ගැටළු හේතුවෙන් ආර්ථික තත්වය ඉන් ඉහළට ඔසවා තැබීමට අවශ්‍ය වන දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලියට අදාල වන පනත් කෙටුම්පත් සම්මත කිරීම පාර්ලිමේන්තුවේ ප්‍රමුඛ කාර්යයක් වූ අතර එය රජයේ ප්‍රතිපත්තිමය තීරණ අනුව සිදු වී ඇත. | |

**4.** **මානව සම්පත් කළමනාකරණ**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු 22 න් තනතුරු 06ක් පුරප්පාඩුව පැවති අතර පුරප්පාඩු වලින් 04 ක්ම ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු විය. ඉන් අධ්‍යක්ෂ ජනරාල් තනතුර 2015 වසරේ සිට පුරප්පාඩුව පවතින අතර, අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුර 2021 ජනවාරි මස සිට පුරප්පාඩුව පවති. සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු 01, 2020 හා 2021 වර්ෂවල සිට පුරප්පාඩුව පවති. එම පුරප්පාඩු තනතුරු පුරවා ගැනීමට හෝ අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කරවා ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතුකර නොතිබුණි. | අධ්‍යක්ෂ ජනරාල් තනතුර අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ යුතු තනතුරකි. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරෙහි වැඩබැලීම අධ්‍යක්ෂ(නීති) නිලධාරියකු විසින් සිදු කරනු ලබයි. | අවශ්‍යතාවය අනුව සේවක පුරප්පාඩු සම්පූර්ණ කර ගත යුතු වීම. |